**08-04-2026** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ශාරීරික අවධානයේ දොරටු සියල්ල ඔබ විසින් වසා දැමිය යුතුයි. එවිට මායාගේ කුණාටු නතර වේවි.

**ප්‍රශ්නය:** පුළුල් හා අසීමිත බුද්ධියක් ඇති දරුවන්ගේ ගති ලක්ෂණ මොනවාද?

**පිළිතුර:** 1) මුළු දවස පුරාම ඔවුන් තුළ ඇත්තේ සේවය හා සම්බන්ධ සිතිවිලියි. 2) සේවය නොකර ඔවුන්ට ඉන්න බැහැ. 3) මුලු ලෝකයම වටලා ගෙන අපිරිසිදු අයව පාරිශුද්ධ කරවන්නේ කෙසේද යන්න තමයි ඔවුන්ගේ සිහියේ තිබෙන්නේ. දුක්ඛිත දේශය සතුටේ දේශය බවට වෙනස් කරවීමේ සේවය ඔවුන් දිගටම කරගෙන යනවා. 4) ඔවුන් නොනවත්වාම තවත් බොහෝ පිරිසක් තමා හා සම අය බවට පත් කරවනවා.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පරමාත්ම පියා මෙහි ඉඳගෙන තම සුමිහිරිම දරුවන්ට කරුණු පහදා කියා දේ: දරුවනි, තම තමන් ජීවාත්මයන් බව සලකා ඔබගේ පරමාත්ම පියා වන මා සිහි කරන්න. එවිට ඔබගේ සෑම දුකක්ම සදහටම අවසන් වී යනවා. තමන් ජීවාත්මයක් බව සලකා සහෝදර බැල්මෙන් සෑම කෙනෙක් දෙසම බලන්න. එවිට ශාරීරික බැල්ම හා ආකල්ප වෙනස් වී යයි. පරමාත්ම පියා අශාරීරික වන අතර ඔය ජීවාත්මයනුත් අශාරීරිකයි. පරමාත්ම පියා බලන්නේ ජීවාත්මයන් දෙසයි. සෑම කෙනෙක්ම තම තමන්ගේ අමරණීය සිහසුන මත අසුන් ගෙන සිටිනා ජීවාත්මයනුයි. ඔය ජීවාත්මයනුත් සහෝදර බැල්මෙන් අන් අය දෙස බැලිය යුතුයි. මෙයට විශාල උත්සාහයක් අවශ්‍යයි. ශාරීරික අවධානයට ඔබ පැමිණි විට තමයි මායාගේ කුණාටු පැමිණෙන්නේ. ශාරීරික අවධානය දෙසට ඇති දොරටු වසා දමන්න. මායාගේ කුණාටු පැමිණීම නතර වේවි. ජීව අවධානයට පත් වීම පිළිබඳ වූ මෙම ඉගැන්වීම පරමාත්ම පියා විසින් ඔබට දෙන්නේ ඉතාමත් සුබ මංගල වූ සංගම යුගයේදීම පමණයි. සුමිහිරි ආධ්‍යාත්මික දරුවනි, අපායේ වෙරළින් පිටතට පා තබා ඇති තමන් දැන් ඉදිරියට ගමන් කරමින් සිටිනා බව ඔබලා දන්නවා. මෙම ඉතාමත් සුබ වූ සංගම යුගය මැදින් ඇති වෙනමම යුගයකි. ඔබගේ බෝට්ටුව ඇත්තේ සාගරය මැදයි: ස්වර්ණමය යුගයේත් නොවෙයි කලි යුගයේත් නොවෙයි. ඔබලා ඉතාමත් උතුම්මවූත් සුබ මංගල වූත් සංගම යුගයේ බ්‍රහමින්වරුනුයි. සංගම යුගය ඇත්තේ බ්‍රහමින්වරුන්ට වන අතර බ්‍රහමින්වරුන් සිටින්නේ ඉහළින්මයි. මෙය බ්‍රහමින්වරුන්ගේ ඉතාමත් කුඩා යුගයයි. මෙම යුගය එක් උපතක යුගයකි: ඒ ඔබගේ සතුටු යුගයයි. කුමන සතුටද? පරමාත්ම දෙවියන් අපට උගන්වයි යන සතුට. එවන් සිසුන්ට විශාල සතුටක් ඇත. මුලු කල්පයම පිළිබඳ වූ ඥානය දැන් ඔබගේ සිහියේ ඇත. බ්‍රහමින්වරුන් වන අප දැන් දේවතාවරුන් වෙමින් සිටිමු. පළමුවෙන්ම අපි අපගේ සුමිහිරි නිවහනට ගොස් එතැනින් නව ලෝකයට යමු. ස්වදර්ශන චක්‍රධාරීන් වන්නේ අප බ්‍රහමින්වරුන් පමණයි. අපි මෙම කරණම ගසමින් යන්නෙමු. මෙම විවිධාකාර වූ රූපය ගැන දන්නේ ඔය බ්‍රහමින් දරුවන් පමණයි. ඔබගේ බුද්ධිය මෙම කරුණු මුලු දවස පුරාවටම ආවර්ජණය කරනවා. සුමිහිරි දරුවනි, මෙය ඔබගේ ඉතාමත් ආදරණීය පවුලයි. එමනිසා ඔබ සෑම කෙනෙක්ම ඉතාමත් ආදරණීය විය යුතුයි. පරමාත්ම පියා මිහිරි අයෙක් වන්නාක් සේම ඔහු ඔය දරුවන්ද මිහිරි කරවනවා. ඔබ කිසිම විටෙක කිසිම කෙනෙක් සමඟ කේන්ති නොගත යුතුයි. ඔබගේ සිතිවිලි, වචන, ක්‍රියා මගින් කිසිම කෙනෙකුට දුකක් නොදිය යුතුයි. පරමාත්ම පියා කවදාවත් කිසිම කෙනෙකුට කිසිම දුකක් දෙන්නේ නැහැ. පරමාත්ම පියාව සිහිපත් කළ තරමට ඔබ තව තවත් මිහිරි වේවි. මෙම ස්මරණය තබා ගැනීමෙන් ඔබගේ බෝට්ටුව එතෙර වී යාවි. මෙය ස්මරණ වන්දනාවයි. සිහි කිරීමෙන් ඔබ සාම දේශය හරහා සතුටු දේශයට යාවි. පරමාත්ම පියා පැමිණ සිටින්නේ ඔය දරුවන්ව සදා සතුටු කරවීමටයි. භූතාත්ම පන්නා දමන ක්‍රමය පරමාත්ම පියා ඔබට පෙන්වා දෙනවා: මා සිහි කරන්න. ඒ භූතාත්මයන් නිතරම පන්නා දමාවි. කිසිම භූතාත්මයක් තමා තුළට ගන්න එපා. කවුරු හෝ කෙනෙක් තුල කුමන හෝ භූතාත්මයක් සිටිනවා නම් ඒ කෙනාව මා ළඟ දමා යන්න. බාබා පැමිණ අපගේ භූතාත්මයන් පළවා හැර අපිරිසිදු අපව පාරිශුද්ධ කරවන්න කියා ඔබ ඉල්ලා සිටිනවා. ඉතින් පරමාත්ම පියා ඔබව ඉතාමත් ලස්සන කරවනවා. බාප් හා දාදා දෙදෙනාම ඔය දරුවන්ව අලංකාර කරවනවා. තම දරුවන්ව අලංකාර කරවන්නේ අම්මයි තාත්තායි නේද? ඒ සීමිත පියෙක් වන අතර මේ අසීමසිත පියායි. දරුවන් මහත් වූ සෙනෙහසකින් එකිනෙකා සමඟ කටයුතු කළ යුතුයි. සියලුම පාපයන්ගේ දානය පිදිය යුතුයි. දානයක් දුන් විට අපල දුරු වෙනවා. මෙයට වෙන කිසිම සමාවට කරුණක් නැහැ. ඕනෑම කෙනෙක්ව ඔබට සෙනෙහසින් හසුරුවා ගත හැකියි. සෙනෙහසින් පහදා දෙන්න. ඒ සෙනෙහස හරිම මිහිරියි. මිනිස්සු සිංහයින් අලින් වැනි

සිව්පාවුන් පවා සෙනෙහසින් හීලෑ කර ගන්නවා. ඒ පාපකාරී දුර්ගුණ සහිත මිනිසුනුයි. නමුත් ඔබලා දැන් දේවතාවරුන් වෙමින් සිටිනවා. ඉතින් එමනිසා ඔබලා දිව්‍යමය ගුණධර්ම ධාරණය කර ගෙන ඉතාමත්ම මිහිරි විය යුතුයි. සහෝදර බැල්මෙන් නැතිනම් සහෝදරයෙක් සහ සහෝදරියක් යන බැල්මෙන් එකිනෙකා දෙස බලන්න. ජීවාත්මයකට තවත් ජීවාත්මයකට දුක් දෙන්න බැහැ. පරමාත්ම පියා කියනවා: සුමිහිරි දරුවනි, මා පැමිණ සිටින්නේ ඔය දරුවන්ට ඔබලාගේ දෙව්ලොව රාජධානිය ලබා දීමටයි.දැන් ඔබට ඕනෑ කරන ඕනෑම දෙයක් මගෙන් ගන්න. මා පැමිණ සිටින්නේ ඔබලාව ද්විත්ව ඔටුණු පළන් ලෝක පාලකවරුන් කරවීමටයි. නමුත් ඒ සඳහා ඔබ යම් උත්සාහයක් දැරිය යුතුයි. මම කාගේවත් ඔළුවේ ඔටුන්නක් පළන්දවන්නේ නැහැ. ඔබ තමාගේම උත්සාහයෙන් අධිරාජ්‍ය තිලකය තමා මතම තබා ගත යුතුයි. පරමාත්ම පියා ඔබට උත්සාහ දැරීමේ මඟ පෙන්වා දෙනවා. මේ අකාරයෙන් ඔබලාට ද්විත්ව ඔටුණු පළන් පාලකවරුන් විය හැකියි. අධ්‍යයනය සඳහා සම්පූර්ණ අවධානය යොමු කරන්න. කිසිඳු විටෙක ඉගෙනීම නතර නොකරන්න. කුමන හෝ හේතුවක් නිසා ඉගෙනීම නතර කළහොත් ඔබට එය සෑහෙන පාඩුවක්. නිතරම තම ලාභ අලාභ දෙස බලන්න. ඔබලා දේව විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයිනුයි. ඔබ ඉගෙන ගන්නේ දෙවියන්, පරමාත්ම පියා සමඟයි. ඒ වන්දනීය දේවතාවරුන් වීමටයි. ඉතින් එමනිසා ඔබලා ඉතාමත් විධිමත් ශිෂ්‍යයින් විය යුතුයි. ශිෂ්‍ය ජීවිතය තමයි හොඳම ජීවිතය. හොඳින් ඉගෙන ගෙන අන් අයටත් ඉගැන් වූ තරමට ඔබ හොඳම අයෙක් වේවි. සුමිහිරි දරුවනි, දැන් මේ ඔබගේ ආපසු යන ගමනයි. ස්වර්ණමය යුගයේ සිට රිදී, තඹ, කලි යුග පසු කර පැමිණියාක් සේ දැන් කලි යුගයේ සිට ස්වර්ණමය යුගය දක්වා ඔබ ඉහළ යා යුතුයි. රිදී යුගයට පැමිණි විට භෞතික ඉන්ද්‍රියන්ගේ දැඟලිල්ල අවසන් වේවි. එමනිසා, කොතෙක් දුරට පියාව සිහි කරනවා ද ඒ තරම් දුරකට රජෝ හා තමෝ මළකඩ ඔබගෙන් දුරු වී යාවි. කෙතරම් දුරකට මළකඩ ඉවත් වෙනවා ද කාන්දම වන පරමාත්ම පියා වෙත වූ ඇදීම ද ඒ තරමින්ම වැඩි වනු ඇත. ජීවය එසේ ආකර්ෂණය වන්නේ නැතිනම් අනිවාර්යෙන්ම එය මළකඩ වලින් පිරී ඇති. සම්පූර්ණයෙන්ම මළකඩ ඉවත් වී ජීවාත්මය පිරිසිදු රත්‍රං වූ විට, කර්මාතීත් අවධිය කියන්නේ එයටයි. තම පවුලේ අයත් සමඟ නිවසේ ජීවත් වන අතර ඔබ නෙළුම් මලක් සේ ජීවත් විය යුතුයි. පරමාත්ම පියා කියනවා: සුමිහිරි දරුවනි, ඔබගේ ගෙදර දොර රැක බලා ගන්න. ඒ වගේම තම ශාරීරික ජීවිකාව සඳහා කළ යුතු සෑම දෙයක්මත් කරන්න. ඒත් සමඟම, මෙම අධ්‍යාපනයත් දිගටම හදාරන්න. අතින් වැඩපළ කරද්දී හදවත ආදරවන්තයා සමඟ තිබෙන්න හරින්න කියා කියනවා. සෑම වැඩ කටයුත්තක්ම කරනා අතර ආදරවන්තයා වන පරමාත්ම පියාව සිහි කරන්න. ඔබලා කල්ප බාගයක ආදරවන්තියන්ය. දැඩි භක්තියක සිටිනා විට ක්‍රිෂ්ණා වැනි අයව ඔවුන් මහත් සෙනෙහසකින් සිහි කරනවා. ඒ දැඩි භක්තියයි. අචල ශ්‍රද්ධාවයි. ක්‍රිෂ්ණා කෙරෙහි වූ අචල ශ්‍රද්ධාවෙන් ඔවුන් සිටියත් ඒ කිසිවකින් කිසිම කෙනෙකුට මුක්තිය ලැබෙන්නේ නැහැ. මෙම ඥානය අඛණ්ඩ ස්මරණයටයි. පරමාත්ම පියා කියනවා: පතිතපාවන, පරමාත්ම පියා වන මා සිහි කළ විට ඔබගේ පාප දුරු වී යාවි. නමුත් මායාත් ඉතාමත් ප්‍රභලයි: ඇය කාවවත් අතහරින්නේ නැහැ. නිතර නිතර මායාට පරාජය වනවාට වඩා බිම බලාගෙන පසුතැවිලි වෙන එක වැඩිය හොඳයි. ඔය මිහිරි දරුවන්ට පරමාත්ම පියා උපදෙස් දෙන්නේ උතුම් අයෙක් වීමටයි. ඇතැම් දරුවන් එතරම් උත්සාහයක් නොදරනා බව දකිනා විට බාබාට ඒ ගැන අනුකම්පා හිතෙනවා. දැන් මෙය පුහුණු කළේ නැතිනම් බොහෝ දඬුවම් විඳීමට සිදු වේවි. සෑම කල්පයකදීම ඔබට පැන්ස කිහිපයක තත්ත්වයක් ලැබීට සිදු වේවි. ඔය සුමිහිරි දරුවන්ට පරමාත්ම පියා විසින් කියා දෙන ප්‍රධානම කරුණ නම්: ජීව අවධානයට පත් වන්න. ඔබගේම ශරීරය ඇතුළු සියළුම ශාරීරික ඥාතීන් අමතක කර දමා නිරන්තරයෙන් මා පමණක් සිහි කරන්න. ඔබ අනිවාර්යෙන්ම පාරිශුද් විය යුතුයි. කුමාරි කෙනෙක් පාරිශුද්ධව සිටි තරමට සෑම කෙනෙක්ම ඇයට හිස නමා ගරු කරනවා. විවාහ වුණු සැනකින් ඇය වන්දනාකාරියක් වන නිසා අන් සෑම කෙනෙක් ඉදිරියේම ඇයට හිස නැමීමට සිදු වෙනවා. කුමාරි කෙනෙක් තම දෙමාපියන්ගේ නිවසේ සිටිනා විට ඥාති සබඳතා රැසක් සිහි කරන්නේ නැහැ. විවාහයෙන් පසුව ශාරීරික ඥාති සබඳතා වැඩි වී තම සැමියා හා දරුවන් කෙරෙහි වූ බැඳීම වැඩි වර්ධනය වෙනවා. තම නැන්දම්මා හා මාමණ්ඩියත් ඇය සිහි කරනවා. පළමුව ඇත්තේ මව හා පියා කෙරෙහි වූ බැඳීම පමණයි. මෙහිදී ඒ සෑම සබඳතාවයක්ම අමතක කර දැමිය යුතුයි. මන්ද සැබෑම මව හා පියා වන්නේ මේ කෙනාම පමණයි. පරමාත්ම සබැඳියාව මෙයයි. ඔබ තමයි මව ඔබ තමයි පියා කියා කියනවා. මෙම මව හා පියා ඔබව ලෝක පාලකවරුන් කරවනා අතර එමනිසා පරමාත්ම පියා කියන්නේ: ඔබගේ අසීමිත පියා වන මා නිතර නිතර සිහි කරන්න. කිසිම ශාරීරික අයෙක් වෙත බැඳෙන්න එපා. කාන්තාවක් තම කලි යුග සැමියාව මහා ඉහළින් සිහි කළත් ඔහු කරන්නේ ඇයව කාණුවක ඇද වැටීමට සැලැස්වීමයි. මේ අසීමිත පියා ඔබව දෙව්ලොව ගෙන යනවා. එවන් මිහිරි පියෙක්ව සිහි කරනා අතර මහත් වූ සෙනෙහසකින් ස්වදර්ශන චක්‍රය කරකවන්න. ඔය ජීවාත්මයන් පාරිශුද්ධ වී දෙව්ලොව පාලකවරුන් බවට පත් වන්නේ මෙම ස්මරණයේ

බලයෙනි. දෙව්ලොව යන නම ඇසුණු සැනකින් ඔබගේ හිතට සතුටක් දැනෙනවා. නිරන්තර ස්මරණයේ රැදෙමින් අන් අයවත් ඒ සඳහා උනන්දු කරවන අය උසස් තත්ත්වයක් හිමි කර ගනීවි. මෙම උත්සාය දැරීමෙන් අවසානයේ දී එම තත්ත්වය ඔබ තුළ ස්ථාවර වේවි. මෙම ලෝකය පැරණි වන අතර ශරීරත් පැරණියි: සියලුම ශාරීරික ඥාතීනුත් ශරීරත් සියල්ල දැන් පැරණියි. දැන් ඒ සියල්ලෙන් තම සිහිය ඉවතට ගෙන පරමාත්ම පියා වෙතටම පමණක් එය යොමු කර තබා ගන්න. එවිට අවසන් මොහොතේදී ඔබ ඒ පරමාත්ම පියාම පමණක් සිහි කරාවි. වෙනත් කිසියම් ඥාතියෙක් ඔබ සිහි කර කර සිටියහොත් අවසානයේදීත් ඒ අයම සිහිපත් වී ඔබගේ තත්ත්වය විනාශ වී යාවි. අවසන් මොහොතේ දී අසීමිත පියාව සිහි කරනා අය සාමාන්‍ය මනුෂ්‍ය තත්ත්වයෙන් නාරායන වේ. පරමාත්ම පියාව සිහි කළ විට ශිවාලයාව වැඩි ඈතක නොවෙයි. සුමිහිරි ආදරණීය බොහෝ කාලයක් තිස්සේ නැති වී සිට මේ දැන් හමු වුණු දරුවන් අසීමිත පියා ළඟට පැමිණ සිටින්නේ තමන්ව ප්‍රාණවත් කර ගැනීමටයි. මන්ද අසීමිත පියාගෙන් අසීමිත රාජ්‍යය හිමි වන බව දරුවන් දන්නවා. මෙය කිසිවිටෙක අමතක නොකළ යුතුයි. මෙය සෑම විටම සිහියේ තබා ගතහොත්, දරුවන්ට අසීමිත සතුටක් දැනේවි. ඇවිදින කරන ගමන් නිතර නිතරම තම බැජය දෙස බලන්න: එය ඔබගේ හදවතේ බැඳ තබා ගන්න. ඔහෝ පරමාත්ම දෙවියන්ගේ ශ්‍රීමත් මඟින් මම මේ තත්වයට පත්වෙනවා. බැජය දෙස බලනා ගමන් ඔහුට ආදරය කරන්න. දිගටම "බාබා,බාබා" කියන්න පරමාත්ම පියා මඟින් තමන් මේ තත්ත්වයට පත් වන බව ඔබට දැනේවි. පරමාත්ම පියාගේ ශ්‍රීමත් පිළිපැදිය යුතුයි නේද? ඔය ආදරණීය දරුවන්ට පුළුල් අසීමිත බුද්ධියක් තිබිය යුතුයි. මුලු දවස පුරාම සේවය පිළිබඳ සිතිවිලි තබා ගන්න. බාබාට අවශ්‍ය කරන්නේ සේවය නොකර ඉන්න බැරි දරුවන්වයි. ඔය දරුවන් මුලු ලෝකයම වැටලිය යුතුයි. අපිරිසිදු ලෝකය පිරිසිදු කරවිය යුතුයි. මුලු ලෝකයම දුක්ඛිත දේශයෙන් සතුටු දේශය බවට වෙනස් කරවිය යුතුයි. ගුරුවරයෙක් ඉගැන්වීමට ආසයි. ඔබලාත් දැන් ඉතාමත් උසස් ගුරුවරුන් වී සිටිනවා. ගුරුවරයෙක් වඩාත් හොඳ වුණු තරමට වැඩි වැඩියෙන් තවත් පිරිස තමා හා සම කරවනා අතර කිසිවිටෙකත් වෙහෙසට පත් වන්නේ නැහැ. දේව සේවයේ නියැලීමෙන් ලොකු සතුටක් විඳිය හැකියි. ඔබට පරමාත්ම පියාගේ සහාය ලැබෙනවා. මෙය විශාල අසීමිත ව්‍යාපාරයකි. ව්‍යාපාරකයන් ධනවත් වෙනවා. ඥාන මාර්ගයේදී වැඩියෙන්ම උද්යෝගයෙන් සිටින්නේ ඔවුනුයි. පරමාත්ම පියා අසීමිත ව්‍යාපාරිකයායි. ගනුදෙනුව පළමු පන්තියේ ගනුදෙනුවකි. නමුත් මේ සඳහා ඔබලා ධෛර්යමත් විය යුතුයි. අලුත් දරුවන්ට පැරණි අයට වඩා උත්සාහයෙන් ඉදිරියට යා හැකියි. සෑම කෙනෙකුගේම වාසනාව ඒ ඒ අයට ආවේණිකයි. ඒ නිසා සෑම කෙනෙක්ම පුද්ගලික උත්සාහයක් දැරිය යුතුයි. පූර්ණ ස්ව පරීක්ෂාව ඔබ විසින් කර ගත යුතුයි. එවන් පරීක්ෂණයන්හි නියාලී සිටින්නන් දිවා රෑ උත්සාහයේ නිරතව සිටිනවා. ඔවුන් ඇයි අපි කාලය අපතේ හරින්නේ? කියා කියාවි. හැකි උපරිමයෙන් අපගේ කාලය වඩාත් ඵලදායි ලෙස යොදවමු. ඔවුන් මේ ලෙස තමන්ට පොරොන්දු වෙනවා: අපි කවදාවත් පරමාත්ම පියාව අමතක කරන්නේ නැහැ. අපි අනිවාර්යෙන්ම ශිෂ්‍යත්වයක් දිනා ගනිමු. එවන් දරුවන්ට උදව් ලැබෙනවා. උත්සාහ දරණා එවන් අලුත් දරුවන් ඔබට දැක ගැනීමට ලැබේවි. තව තවත් ළඟට එන්න එන්න සතුටින් ඔබ නටාවි. එක් පැත්තකින් හේතුවක් නැති ලේ ගැලීම් පවා සිදු වේවි. ඔය දරුවන්ගේ දේව තරඟය සිදු වෙමින් පවතිනවා. ඔබ නොනවත්වා ඉදිරියට දිවගෙන යද්දී නව ලෝකයේ දර්ශන තව තවත් ඔබට ලං වන අතර ඔබගේ සතුටත් දිගටම වැඩිවේ. සිදුවන සිදුවීම ළඟ ඉඳන් නැරඹිය නොහැකි අය එතරම් සතුටක් විඳින එකක්ක නැහැ. කලි යුග ලෝකයේ ඇත්තේ නිරාශාව වන අතර ස්වර්ණමය යුග ලෝකය කෙරෙහි දැඩි සෙනෙහසක් ඇත. ශිව බාබාව සිහි කළහොත් ඔබ දෙව්ලොව උරුමයද සිහි කරනු ඇත. දෙව්ලොව උරුමය සිහි කළහොත් ශිව බාබාව ද සිහි වේවි. තමන් දැන් දෙව්ලොවට යාමට සිටිනා බව ඔය දරුවන් දන්නවා: ඔබගේ දෙපා අපාය දෙසටත් හිස දිව්‍ය ලෝකය දෙසටත් යොමු වී තිබෙනවා. දැන් මේ ඇත්තේ මහළු සෑම කෙනෙකුගේම විශ්‍රාම අවධියයි. බාබා නිතරම මෙම සතුටිනුයි සිටින්නේ: ඔහෝ මම ගිහින් මේ පුංචි ක්‍රිෂ්ණා වෙන්නම්. තෑගි බෝග සියල්ල කල්තබාම යවා ඇත්තේ ඔහුටයි. ඉහළම විශ්වාසයෙන් සිටිනා ගෝපිකාවරුන් පමණයි තෑගි එවන්නේ. අතීන්ද්‍රිය සතුටින් සිටින්නේ ඔවුනුයි. අපි අමරණීය දේශයේ දේවතාවරුන් වෙමු. මීට පෙර කල්පයේ දී ඒ තත්ත්වයට පත් වී පසුව උපත් 84 ක් ගත්තේ අපියි. මෙම පිණුම සිහියේ තබා ගත්තා නම් එය ද ලොකු වාසනාවකි: සෑම විටම අසීමිත සතුටින් සිටින්න. ඔබ ලොකු ලොතරැයියක් දිනනනවා. වසර 5000 කට පෙර අපි අපගේ රාජ්‍යයේ වාසනාව දිනා ගත් අතර නැවතත් හෙටත් අපි එය දිනා ගනිමු: එය නාටකයේ නියමිත වූවකි. හරියටම මීට පෙර කල්පයේදී කළ ආකාරයෙන්ම අපි උපදිනා අතර මේ මව්වරුන් හා පියවරුන්ම අපට ලැබේවි. ක්‍රිෂ්ණාගේ පියා වුණු කෙනා නැවතත් එසේම වේවි. මුලු දවස පුරාම එවන් සිතවිලි වලින් සිටිනා අය හරිම විනෝදයෙන් සිටීවි. ඥාන සාගරය ආවර්ජණය කළේ නැතිනම් ඉන් අදහස් වන්නේ ඔබ රෝගී වී ඇති බවයි. එළදෙනක් වරක් ගත් ආහාරය නැවත නැවත මුලු දවස පුරාම වමාරමින්

කනවා: මුලු දවස පුරාම ඇයගේ කට සෙලවෙනවා. එසේ කට සෙලවෙන්නේ නැතිනම් ඉන් අදහස් වන්නේ ඇය ලෙඩින් සිටිනා බවයි. මෙහිදීත් එසේමයි. අසීමිත පියාත් දාදාත් දෙදෙනාම සුමිහිරි දරුවන්ට හරිම ආදරෙයි. ඔහු මහත් සෙනෙහසකින් ඔබට උගන්වා අවලස්සන ඔබව ලස්සන කරවනවා. ඉතින් එමනිසා ඔය දරුවන්ගේ සතුටේ රසදිය කඳ ඉහල යා යුතුයි. ස්මරණ වන්දනාවෙන් රසදිය කඳ ඉහල යාවි. පරමාත්ම පියා සෑම කල්පයදීම අපූරු සේවයක් කරනවා. ඔහු සෑම කෙනෙක්වම පාරිශුද්ධ කරවනවා. පංච මහා භූතයින්ව පවා. මෙය එතරම් විශාල අසීමිත සේවයක්. පරමාත්ම පියා ලොකු සෙනෙහසකින් නොකඩවාම ඔබට උගන්වන්නේ දරුවන්ව නිවැරදි කරවීම පරම පියාගේත් පරම ගුරුවරයාගේත් රාජකාරිය වන නිසායි. ඔබලා උසස් කරවන ශ්‍රීමත් පරමාත්මේ පියාගෙනුයි. සෙනෙහසින් පරම පියාව සිහි කරනා තරමට ඔබ ද තව තවත් උසස් වනු ඇත. තමන් ශ්‍රීමත් පිළිපදිනවා ද නැතිනම් තමාට හිතෙන හිතෙන දේ කරනවාද කියාත් ඔබ වාර්තාවේ ලියා දැක්විය යුතුයි. ඔබ නිවැරදි වන්නේ ශ්‍රීමත් අනුගමනය කිරීමෙන් පමණයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. තමාටම පොරොන්දු වන්න: අපි අපගේ කාලය අපතේ හරින්නේ නැහැ. සංගම යුගයේ සෑම මොහොතක්ම අපි නිසි ලෙස ප්‍රයෝජනයට ගනිමු. අපි කවදාවත් බාබාව අමතක කරන්නේ නැහැ. අපි අනිවාර්යෙන්ම ශිෂ්‍යත්වයක් දිනා ගනිමු.
2. දැන් මේ ඇත්තේ තම විශ්‍රාමික අවධියයි යන අවධානයේ සෑම විටම සිටින්න. ඔබගේ පාද අපාය දෙසටත් හිස දෙව්ලොව දෙසටත් යොමු වී ඇත. මෙම පිණුම සිහි කරමින් සතුටින් සිටින්න. ජීවාත්ම අවධානයට පත් වීමට උත්සාහ දරන්න.

**වරදානය:** ඔබ බල අධිකාරිත්වයේ ප්‍රතිමූර්තියක් වී, බොහෝ ජීවාත්මයන්ට යහපතක් සිදු කිරීමේ ඔබගේ වඩාත් ශ්‍රේෂ්ඨ තත්ත්වය පිලිබඳව කුල්මත්බවක් ඔබට තිබේවා.

අපි සර්ව බලධාරියාගේ දරුවන්ය: ඔබගේ වඩාත්ම උසස් තත්ත්වය මෙයයි. මෙම තත්ත්වයේ කුල්මත්භාවයේ රැදී සිටින්න**,** එවිට මායා මත ඇති යැපීම අවසන් වෙයි. මෙම අධිකාරිත්වයේ ප්‍රතිමූර්තියක් වීමෙන් ඔබට ඕනෑම ජීවාත්මයකට සෙත සැලසිය හැක. මෙම කුල්මත්බව නිරන්තරයෙන් ඇති අය සෑම කලටම ඔවුන්ගේ රාජධානියේ භාග්‍යය හිමි කරගනියි. මෙම බල අධිකාරිත්වය නිරන්තරයෙන් පවත්වා ගන්න එවිට ලෝකය ඔබ ඉදිරියේ හිස නමනු ඇත. ඔබ කිසිවෙකුට හිස නොනමයි.

**පාඨය:** කරවන්හාර් පියා (සියළු දෙනාට ක්‍රියා කිරීමට දිරිගන්වන ඒකායන කෙනා) පිලිබඳ අවධානයෙන් 'මගේ' යන සියළු අවධාන අවසන් කරන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: ශ්‍රේෂ්ඨ වීම සඳහා මිහිරිබව සහ නිහතමානිකමේ ගුණධර්ම ධාරණය කරගන්න.**

ඔබගේ මිහිරියාවෙන් පරම පියාට ඔබේ සමීපබවේ දර්ශන ලබා දෙන්න. ඔබගේ සිතිවිලි වල මිහිරියාව, වදන් වල මධුරබව සහ ක්‍රියා තුල මිහිරියාව තිබිය යුතුයි. පරම පියාට ඔබගේ සමීපබව මෙයයි. මේ නිසයි පියා ඔබට දිනපතාම මෙසේ පවසන්නේ: සුමිහිරිතම දරුවනේ! එවිට ඔය දරුවන් පිලිතුරු දෙන්නේ: මිහිරිතම බාබා! දිනපතා මෙම මිහිරියාවේ වදන් ඔබව මිහිරි කරයි.